# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,753—1959 මැයි 29 වැනි සිකුරාද — 29.5.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**අංක 27 දරණ ආහාර මිළ නියෝගය.** **සීනි.**

**1950 අංක 29 දරණ මිළ පාලන පණත**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් කම්බයියා සිවඥනම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 3 (2) දරණ වගන්තිය සමග කියවියයුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1956 මැයි 18 දින සහ අංක 10,930 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරනලද 1956 මැයි 10 දින සහ අංකය එච් 25 දරණ හම්බන්තොට ආදයම් දිස්ත්‍රික්කය තුළ තොග වශයෙන් සහ සිල්ලර වශයෙන් සීනි විකිණිය හැකි වැඩිම මිළ පිළිබඳ මගේ ආහාර සහ මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගුකරමි.

(2) තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද සිල්ලර වශයෙන් විකිණීමේදී බර රාත්තලක්ද විකුණනු ලබන මෙහි දක්වෙන 1 වන උප ලේඛනයේ විස්තර සඳහන් සීනි, 2 වන උප ලේඛනයේ 2 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 2 වන තීරයේ සඳහන් මිළ ගණන් සීනි විකිණීමේදී අනුපිළිවෙලින් තොග වශයෙන් සහ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවද, හම්බන්තොට ආදයම් දිස්ත්‍රික්කය තුළ සීනි ඊට වැඩි ගණනකට නොවිකිණිය යුතු බවද නියෝග කරමි.

(3) මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ විස්තර කරනු ලබන සීනිවලට මෙම නියෝගයේ වගන්ති බල පවත්වනු ලබන බව නියෝග කරමි.

(4) මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සීනි දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ කොයි අන්දමකට හෝ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ආ) සීනි පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ඇ) දුඹුරු සීනි විකුණන විට එය යම්කිසි දෙයක බහා හෝ ඔතා දෙන දෙයක් වේනොත් එහි මිළත් මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 2 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 2 වන තීරයේ සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වී ඇති බවත් ;

(ඈ) " සීනි " යන්නෙන් සියලුම හකුරු වර්ග අත්හැර සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියමකරමි.

(5) මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් මොනම වර්ගයක හෝ ශ්‍රෙණියක හෝ සීනි වෙන මොනයම් ද්‍රව්‍යයක් හෝ වෙන් මොනයම් බාල වර්ගයේ ද්‍රව්‍යයක් හෝ මිශ්‍ර කර කිසිම වෙළෙන්දෙක් නොවිකිණියයුතු බව නියෝග කරමි.

(6) මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 1 වන තීරය සහ 3 වන උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශයක, මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් විස්තර සහ ශ්‍රෙණිය සීනි විකිණීමට තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම, එම සීනිවලට මේ නියෝගයෙන් නියම කරන වැඩිම මිළ ගණන් දක්වන දැන්වීමක් තමාගේ ස්ථානයේ (ගබඩාව හෝ වෙළඳ සැල) ප්‍රකටව පෙනෙන පරිදි තැබියයුතු බව නියෝගකරමි.

(7) මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 1 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුළ මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් විස්තර සහ ශ්‍රෙණිය සීනි විකුණන සෑම වෙළෙන්දෙක්ම ඒ ද්‍රව්‍ය මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සීනි ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ සීනිවල විස්තර සහ ශ්‍රෙණිය ;

(ඈ) විකුණූ සීනි ප්‍රමාණයට ගෙවූ මුදල සහ ;

(ඉ) වෙළඳාමේ ස්වභාවය එනම් වෙළඳම තොග වශයෙන්ද නැත්නම් සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බව නියෝග කරමි.

1959 මැයි මස 19 දින පෙරවරු 10ට හම්බන්තොට කච්චේරියේ දී අත්සන් කරන ලදි.

ටී. සිවඥනම්,
නියෝජ්‍ය (ආහාර) මිළ පාලක,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

1351—ජේ. ඇන්. ආර් 2241 —4,316 (5/59)

### 1 වන උපලේඛනය

සීනිවල විස්තර සහ ශ්‍රෙණිය — දුඹුරු සීනි

### 2 වන උපලේඛනය

| | 1 වන තීරය ප්‍රදේශය | 2 වන තීරය තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක වැඩිම මිළ රු. ශ. |
|---|---|---|
| 1. | රත්න ... ... ... ... ... | 60 0 |
| 2. | අම්බලන්තොට ... ... ... ... ... | 60 0 |
| 3. | හම්බන්තොට ... ... ... ... ... | 60 0 |
| 4. | තිස්ස ... ... ... ... ... ... | 60 20 |
| 5. | තංගල්ල ... ... ... ... ... | 59 70 |
| 6. | බෙලිඅත්ත ... ... ... ... ... | 59 73 |
| 7. | දෙද්දුවාවල ... ... ... ... ... | 59 73 |
| 8. | මහවෙල ... ... ... ... ... | 59 70 |
| 9. | වීරකැටිය ... ... ... ... ... | 60 0 |
| 10. | වලස්මුල්ල ... ... ... ... ... | 60 0 |
| 11. | කටුවන ... ... ... ... ... | 60 0 |
| 12. | කිරම ... ... ... ... ... ... | 60 0 |
| 13. | මිද්දෙනිය ... ... ... ... ... | 60 0 |

### 3 වන උපලේඛනය

| | 1 වන තීරය ප්‍රදේශය | 2 වන තීරය සිල්ලර වශයෙන් විකිණීමේදී රාත්තලක වැඩිම මිළ රු. ශ. |
|---|---|---|
| 1. | බටහිර ගිරුවා පත්තුව යන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... | 0 57 |
| 2. | නැගෙණහිර ගිරුවා පත්තුව සහ මාගම් පත්තුව යන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශ ... | 0 58 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණීමේ වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

අංකය 28 දරණ ආහාර මිළ නියෝගය — සීනි

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1956 මැයි 18 දින සහ අංක 10,930 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරනලද 1956 මැයි 10 දින සහ අංකය එච් 24 දරණ හම්බන්තොට ආදයම් දිස්ත්‍රික්කය තුළ තොග වශයෙන් සහ සිල්ලර වශයෙන් සීනි විකිණිය හැකි වැඩිම මිළ පිළිබඳ මගේ ආහාර සහ මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

(2) තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද සිල්ලර වශයෙන් විකිණීමේදී බර රාත්තලක්ද විකුණනු ලබන මෙහි දක්වෙන 1 වන උප ලේඛනයේ විස්තර සඳහන් සීනි, 2 වන උප ලේඛනයේ 2 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 2 වන තීරයේ සඳහන් මිළ ගණන් සීනි විකිණීමේදී අනුපිළිවෙලින් තොග වශයෙන් සහ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවද හම්බන්තොට ආදයම් දිස්ත්‍රික්කය තුළ සීනි ඊට වැඩි ගණනකට නොවිකිණිය යුතු බවද නියෝග කරමි.

(3) මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ විස්තර කරනු ලබන සීනිවලට මෙම නියෝගයේ වගන්ති බලපවත්වනු ලබන බව නියෝග කරමි.

(4) මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සීනි දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ කොයි අන්දමකට හෝ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ආ) සීනි පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ඇ) සුදු සීනි විකුණන විට එය යම්කිසි දෙයක බහා හෝ ඔතා දෙන දෙයක් වෙතොත් එහි මිළත් මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 2 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 2 වන තීරයේ සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත්වී ඇති බවත් ;

(ඈ) " සීනි " යන්නෙන් සියලුම හකුරු වර්ග අත්හැර සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියමකරමි.

(5) මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් මොනම වර්ගයක හෝ ශ්‍රෙණියක හෝ සීනි වෙන මොනයම් ද්‍රව්‍යයක් හෝ වෙන මොනයම් බාල වර්ගයේ ද්‍රව්‍යයක් හෝ මිශ්‍ර කර කිසිම වෙළෙන්දෙක් නොවිකිණියයුතු බව නියෝග කරමි.

(6) මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 1 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශයක, මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් විස්තර සහ ශ්‍රෙණිය සීනි විකිණීමට තබාගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම; එම සීනිවලට මේ නියෝගයෙන් නියම කරන වැඩිම මිළ ගණන් දක්වන දැන්වීමක් තමාගේ ස්ථානයේ (ගබඩාව හෝ වෙළඳ සැළ) ප්‍රකටව පෙනෙන පරිදි තැබියයුතු බව නියෝග කරමි.

(7) මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 1 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුළ මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් විස්තර සහ ශ්‍රෙණිය සීනි විකුණනු ලබන සෑම වෙළෙන්දෙක්ම ඒ ද්‍රව්‍ය මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සීනි ප්‍රමාණය ;

(ඇ) විකුණූ සීනිවල විස්තර සහ ශ්‍රෙණිය ;

(ඈ) විකුණූ සීනි ප්‍රමාණයට ගෙවූ මුදල ; සහ

(ඉ) වෙළඳාමේ ස්වභාවය එනම් වෙළඳාම තොග වශයෙන්ද නැතිනම් සිල්ලර වශයෙන්ද යන වග ; ඇතුළත් කුවිතාන්සියක් දියයුතු බව නියෝගකරමි.

1959 මැයි මස 19 දින පෙරවරු 10ට හම්බන්තොට කච්චේරියේදී අත්සන් කරන ලදි.

ටී. සිවඥනම්,
නියෝජ්‍ය (ආහාර) මිළ පාලක,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

1 වන උපලේඛනය

සීනිවල විස්තර සහ ශ්‍රෙණිය — සුදු සීනි

2 වන උපලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| 1. රත්න ... ... ... ... ... | 67 50 |
| 2. අම්බලන්තොට ... ... ... ... ... | 67 50 |
| 3. හම්බන්තොට ... ... ... ... ... | 67 50 |
| 4. තිස්ස ... ... ... ... ... ... | 68 0 |
| 5. තංගල්ල ... ... ... ... ... | 67 48 |
| 6. බෙලිඅත්ත ... ... ... ... ... | 67 48 |
| 7. දෙද්දුවාවල ... ... ... ... ... | 67 48 |
| 8. මහවෙල ... ... ... ... ... | 67 48 |
| 9. වීරකැටිය ... ... ... ... ... | 68 0 |
| 10. වලස්මුල්ල ... ... ... ... ... | 68 0 |
| 11. කටුවන ... ... ... ... ... | 68 0 |
| 12. කිරම ... ... ... ... ... ... | 68 0 |
| 13. මිද්දෙනිය ... ... ... ... ... | 68 0 |

3 වන උපලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| 1. බටහිර ගිරුවා පත්තුව යන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය ... ... | 0 64 |
| 2. නැගෙනහිර ගිරුවා පත්තුව සහ මාගම් පත්තුව යන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශ ... | 0 65 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණීමේ වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

අංක 1/59 දරන මිල නියෝගය. සහල් සහ වී (තොග සහ සිල්ලර වශයෙන්).

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක කැප්පත් ජෝන් වින්සන්ට් ඥානප්‍රගාසම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වන වගන්තියෙන් හා 3 (2) යන වගන්තියෙන්ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,319 සහ 1958 මැයි 26 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 1/58 සහ 1958 මැයි 24 වෙනි දින දරණ මිළ නියෝගය, 1959 ජූනි 1 වැනි දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) 1959 ජූනි මස 1 වෙනි දින සිට මීට යාකර ඇති 1 වෙනි උපලේඛනයේ 2 වැනි, 3 වැනි තීරවල සඳහන් මිළ ගණන් තොග වශයෙන් සහල් සහ වී විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් එම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) 1959 ජූනි මස 1 වෙනි දින සිට මීට යාකර ඇති 2 වැනි උපලේඛනයේ 2 වැනි, 3 වැනි තීරවල සඳහන් මිළ ගණන් සිල්ලර වශයෙන් සහල් සහ වී විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) තවද මේ නියෝගයේ කාර්‍ය්‍යය සඳහා—

(අ) සහල් හෝ වී ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සහල් හෝ වී වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) සහල් හෝ වී ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(5) සහල් හෝ වී විකිණීමේදී වෙනත් ද්‍රව්‍යයන් හා මිශ්‍රකොට බාල කිරීමෙන් සහල් හෝ වී නොවිකිණිය යුතු බවත්,

(6) සහල් හෝ වී විකිණීමේදී සහල් හෝ වී යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිලත් එම උපලේඛනවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් හෝ වී යම් ස්ථානයක හෝ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම සහල් හෝ වී සඳහා නියම කරනු ලැබූ වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවත්,

(8) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා '' රාත්තල් '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

(9) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සැම ප්‍රදේශයකම සහල් හෝ වී තොග වශයෙන් විකුණන සැම තැනැත්තෙකුම හා සහල් හෝ වී සිල්ලර වශයෙන් විකුණන සැම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සහල් හෝ වී ප්‍රමාණය ;

(ඇ) විකුණූ සහල් හෝ වී ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළදී ගන්නාට දිය යුතු බවත්,

මෙයින් නියම කරමි.

1959 මැයි මස 25 වෙනි දින ප.ව. 2 ට පුත්තලම් කච්චේරියේදී අත්සන් කරන ලදී.

ජේ. වී. ඥානප්‍රගාසම්,
පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන.

## 1 වැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල්<br>ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. | 3 වැනි තීරය<br>වී<br>ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. |
|---|---|---|
| ලුණුවිල | 19 11 | 9 56 |
| නාත්තන්ඩිය, මාදම්පේ, හලාවත සහ ආරච්චිකට්ටුව | 19 29 | 9 65 |
| මහවැව සහ බත්තුළුඔය | 19 36 | 9 68 |
| උතුරු පිටිගල් කෝරළේ සහ දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශික ආදයම් නිලධාරි තැනගේ අනිකුත් සියලුම ප්‍රදේශ | 19 18 | 9 59 |
| පුත්තලම | 19 45 | 9 73 |
| ඒත්තාලේ | 19 71 | 9 86 |
| මදුරන්කුලිය | 19 53 | 9 77 |
| කල්පිටිය | 19 73 | 9 87 |
| ආණමඩුව | 19 74 | 9 87 |

## 2 වැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සහල්<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. | 3 වැනි තීරය<br>වී<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල<br>රු. ශ. |
|---|---|---|
| උතුරු පිටිගල් කෝරළේ ප්‍රදේශයට අයිති පුලියන්කඩවර, පුලියන්කාර, කොක්කාවිල, ඇලපහල සහ පුන්ච්චිලත්තව | 0 18 ½ | 0 9 ½ |
| උතුරු පිටිගල් කෝරළේ සහ දකුණු පිටිගල් කෝරළේ ප්‍රදේශයේ අනිකුත් සියලුම ප්‍රදේශ | 0 18 ¼ | 0 9 |
| පුත්තලම | 0 18 ¼ | 0 9 |
| ඩච්බේ, එලවන්කුලම සහ නවගත්තේගම | 0 18 ¾ | 0 9 ½ |
| පුත්තලම, කල්පිටිය සහ ආණමඩුව ප්‍රාදේශික ආදයම් නිලධාරිගේ අනිකුත් සියලුම ප්‍රදේශ | 0 18 ½ | 0 9 ½ |

**සැළකිය යුතුයි.**—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිල නොවේ, මේවා. ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. එම මිල ගණන්වලට ඉහළින් එම ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

(2) ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි තොග වශයෙන් විකුණනු ලබන යම් සහල් හෝ වී ප්‍රමාණයක් ඇතහොත් එයට ගෙවිය යුතු වැඩිම මිළ ශුද්ධ බර හොණ්ඩරයකට ගෙවන ඉහත සඳහන් මිල අනුව ගණන් බලා මිල තීරණයක් ගත යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.